# A Farewell to Gabo and Mercedes

Rodrigo García

# සුබ ගමන් ගාබෝ, මර්සිඩීස්

*A Son's Memoir of Gabriel García Márquez and Mercedes Barcha*

රොද්රිගෝ ගාර්සියා

පරිවර්තනය

**මහේෂි වීරකෝන්**



# A Farewell to Gabo and Mercedes

Rodrigo García

# සුබ ගමන් ගාබෝ, මර්සිඩීස්

රොද්රිගෝ ගාර්සියා

පරිවර්තනය
**මහේෂි වීරකෝන්**

ත්‍රිමාණ ප්‍රකාශන (පෞද්ගලික) සමාගම

# පළමු වැනි කොටස

ඉන්පසු ඔහු සර්කසය ගැන සිතමින් චෙස්ට්නට් ගහ වෙත ගියේ ය. මූත්‍රා කරන අතරත් දිගට ම සර්කසය ගැන සිතන්නට උත්සාහ කළ නමුදු ඔහුට තව දුරටත් මතකය සොයා ගත නොහැකි විය. කුකුළු පැටවෙකු මෙන් සිය දෙවුර අතර ඔළුව හකුළා ගත් ඔහු, චෙස්ට්නට් ගසේ කඳට නළල ගසා ගෙන නිසොල්මන් ව හුන්නේ ය. පසුව දා උදේ එකොහළට සන්තා සොෆියා දෙ ලා පීදාද් නිවසේ පිටුපස්සට කුණු වීසි කරන්නට යද්දී බිමට පාත් වෙන ගිජු ලිහිණියන් විසින් ඇගේ අවධානය ඇද ගන්නා තුරු පවුලේ උදවිය ඔහු සොයා ගත්තේ නැත.

*- One Hundred Years of Solitude*



# 1

මමත්, මගේ සොයුරාත් කුඩා දරුවන්ව සිටිය දී, දෙදහස වසර උදාව ඔහු සමඟ ගත කිරීමේ පොරොන්දුවක් තාත්තා අපෙන් ලබා ගත්තේ ය. අපේ යොවුන් කාලයේදී ඒ පොරොන්දුව ගැන කීප වතාවක් ඔහු අපිට මතක් කළ අතර, ඔහු උදක් ම එලෙස කියා සිටීම මට මහත් අපහසුකාරී විය. අවසානයේදී, ඒ දවස වෙද්දීත් ජීවත් ව සිටීමට ඔහු තුළ වූ ප්‍රාර්ථනය ලෙස එය අර්ථ දැක්වීමට මම පෙලඹුණෙමි. ඔහුට හැත්තෑ දෙකක් වේවි. මට හතළිහක්. විසි වන සියවස අවසාන වෙයි. මා නව යෞවනයකුව සිටිය දී මේ කඩඉම් ඉතා ඈත ඇති ඒවා ලෙස පෙනුණේ නැත. මගේ මල්ලිත්, මමත් වැඩිහිටියන් වූ පසු, පොරොන්දුව සිහි කෙරුණේ කලාතුරකිනි. නමුත් ඇත්තට ම, නව සහශ්‍රය උදා වූ රාත්‍රියේ දී අපි සියලු දෙනා තාත්තාගේ ප්‍රියතම නගරය, කාර්තහේනා දෙ ඉන්දියාස් හි දී එකට එකතු වී සිටියෙමු. "අපිට ගනුදෙනුවක්, තිබුණා; ඔයාටයි මටයි." තාත්තා ලැජ්ජාවෙන් මට කීවේ බාගවිට, ඒ වේලාවේ ඔහුගේ බල කිරීම ගැන මඳක් අපහසුවට පත් වෙමිනි. "ඒක හරි..." මම කීවෙමි. ඉන් පසු නැවත කිසි දිනක අපි ඒ ගැන කතා කළේ නැත. ඔහු තවත් වසර පහළොවක් ජීවත් වූයේ ය.

ඔහු පසු හැට වැනි වියේ පසු වෙද්දී, විදුලි එළි නිවා දැමුවාට පසු ඔහු සිතන්නේ මොනවා ගැන දැ යි මම ඇසුවෙමි. "දේවල් ඉවර වෙලා ම වගේ කියලා මට හිතෙනවා." ඉන්පසු ඔහු මඳ සිනහවක් පා මෙසේ එකතු කළේ ය. "ඒත් තාම කාලේ තියෙනවා. දැන් ම කරදර වෙන්න ඕනේ නෑ." ඔහුගේ සුභවාදීත්වය අව්‍යාජ විය. එය මා සැනසීමේ උත්සාහයක් නොවේ. "දවසක නින්දෙන් ඇහැරෙද්දී ඔයා නිකන් ම වයසට ගිහින්. කිසිම දැනුම් දීමක් නැති ව. ඒක මහා පුදුමයි," ඔහු කීවේ ය. "අවුරුදු ගාණකට කලින් මට ඇහිලා තියෙනවා, ලේඛකයකුගේ ජීවිතේ කාලයක් එනවලු තවදුරටත් දිග ප්‍රබන්ධයක් ලියන්න බැරි වෙන. තවදුරටත් විශාල නිර්මාණයක් අල්ලගෙන ඉන්නවත්, දිග නවකතාවක අනතුරුදායක ගමන තරණය කරන්නවත් ඔළුවට බැරි වෙනවා. ඒක ඇත්ත... මට දැන්

ඒක දැනෙනවා. ඉතින් ඒ නිසා දැන් ඉඳන් කෙටි ලියමන් විතරයි."

ඔහුට වයස අසූවක් වූ විට, එය කොයි වගේ දැ යි මම ඇසුවෙමි.

"අසූවට පේන දර්ශනය විස්මිත යි, ඇත්තට ම. ඒ වගේ ම අවසානේ ළඟ යි."

"ඔයාට බය යි ද?"

"මට අපරිමාණ දුකක් ඇති වෙනවා."

මේ මොහොතවල් ගැන මම නැවත සිතද්දී, ඔහු කෙතරම් කැමැත්තෙන් ඒවාට පිළිතුරු දුන්නා දැ යි යන කාරණය මා සැබෑවට ම හැඟුම්බර කරයි. විශේෂයෙන් ම, ප්‍රශ්නවල කුරිරු බව සැලකූ විට...

# 2

මෙදදහස් දාහතරේ මාර්තු මාසයේ සතියේ දින උදෑසනක මම අම්මා අමතමි. දින දෙකක් තිස්සේ තාත්තාට සෙම්ප්‍රතිශ්‍යාව වැලඳී ඇඳට වී ඉන්නා බව ඇය මට කියයි. මෙය ඔහුට අසාමාන්‍ය තත්ත්වයක් නොවෙයි. නමුත් මේ වතාවේ එය වෙනස් බව ඇය මට සහතික කරයි. "එයා කන්නේ නෑ. එයා නැගිටින්නෙ නෑ. එයා, එයා නෙමෙයි. එයාට සිහියක් පතක් නෑ. ආල්වාරෝටත් පටන් ගත්තේ මේ විදිහට." ඇය එකතු කරන්නේ කලින් වසරේ මියගිය තාත්තාගේ පරම්පරාවේ මිතුරෙකු ගැන සඳහන් කරමිනි. "අපි මේකෙන් නම් බේරෙන්නෙ නෑ." ඒ ඇගේ රෝග විග්‍රහය යි. දුරකථන ඇමතුමෙන් පසු මා බියට පත් නොවන්නේ අම්මාගේ අනාවැකි සාංකාවට බැර කළ හැකි නිසා ය. කොහොමත් ඇය, යම් සංඛ්‍යාතයකට අනුව පැරණි මිතුරන් මියයන ජීවිත කාල පරිච්ඡේදයකට ඇතුළු වී සිටියා ය. එමෙන් ම මෑතක දී ඇගේ සොයුරු සොයුරියන් දෙදෙනෙකුගේ අහිමි වීම ඇය දැඩි ලෙස සසල කොට තිබිණි. ඒ ඇයගේ බාලතම සහ ආදරණීය ම සොයුරු සොයුරියන් දෙපළකි. ඒ කෙසේ වෙතත්, දුරකථන ඇමතුම මගේ හිතළු අවුළුවයි. අවසානය පටන් ගන්නේ මෙහෙම ද?

දෙවතාවක් පිළිකා රෝගය වැලඳී සුවය ලැබූ මගේ මව වෛද්‍ය පරීක්ෂණ සඳහා ලොස් ඇන්ජලීස් වෙත යාමට නියමිත ව තිබිණි. එනිසා තීරණය කෙරුණේ පැරීසියේ වාසය කරන මගේ සොයුරා තාත්තා බලා ගැනීමට එහි සිට මෙක්සිකෝ සිටි නගරයට පැමිණෙන්නට යි. මම අපේ අම්මා සමඟ කැලිෆෝනියාවේ හිඳිමි. මගේ සොහොයුරා පැමිණි සැණින්, තාත්තාගේ හෘද විශේෂඥයා මෙන් ම ඔහුගේ ප්‍රධාන වෛද්‍යවරයා, තාත්තාට නිව්මෝනියාව වැලඳී ඇති බවත්, වැඩිදුර පරීක්ෂණ සඳහා ඔහු රෝහලට ඇතුළත් කරන්නට හැකි නම් එය වෛද්‍ය කණ්ඩායමට වැඩි පහසුවක් වෙනු ඇති බවත් කියයි. පෙනුණු ලෙස, අඩු ම තරමින් දින කිහිපයක් පුරා ඔහු මේ කාරණය අම්මාට යෝජනා කර ඇති නමුත් ඇය ඊට මැලි වී තිබේ. බාග විට, නියම ශාරීරික පරීක්ෂණයකින් අනාවරණය විය හැකි දෙය ගැන ඇය බිය වන්නට ඇත.

# 3

ඉන් පසු ගත වූ දින කිහිපයේ දී මගේ සොයුරා සමඟ ඇති වූ දුරකථන සංවාද, රෝහලේ රැඳී සිටීම පිළිබඳ පින්තූරයක් සිතුවම් කර ගැනීමට මට ඉඩ සලසා දුන්නේ ය. මගේ සොහොයුරා තාත්තා ඇතුළත් කරද්දී පරිපාලන නිලධාරිණිය ඔහුගේ නම අසා උඩ පනී. "අම්මෝ... මගේ දෙයියනේ, ලේඛකයා ද? මම මගේ නෑනාට කෝල් කරලා කිව්වට කමක් නැද්ද? එයා මේක දැන ගන්න ම ඕනේ." ඔහු එය නොකරන්නැ යි ඇයට ආයාචනා කරන අතර ඇය පැකිළීමෙන් ඊට අවනත වෙයි. ඔහුගේ පුද්ගලිකත්වය ආරක්ෂා කෙරෙනු වස් තාත්තා ශාලාව කෙළවරේ ඇති, සාපේක්ෂ ලෙස හුදෙකලා කාමරයක රඳවයි. නමුත් වරුවක් ඇතුළත වෛද්‍යවරුන්, හෙද හෙදියන්, ආවතේවකරුවන්, කාර්මික ශිල්පීන්, අනෙකුත් රෝගීන්, නඩත්තු කිරීමේ සහ පිරිසිදු කිරීමේ සේවකයින්, බාගවිට පරිපාලන නිලධාරිණිය ගේ නෑනණ්ඩියත්, යාන්තමින් හෝ ඔහු බලා ගන්නට ඔහුගේ දොර පසු කරගෙන යයි. ඒ කොටසට ඇතුළු වීම සීමා කිරීමෙන් රෝහල ඊට ප්‍රතිචාර දක්වයි. රෝහලේ ප්‍රධාන ගේට්ටුවට පිටතින් පුවත් පත් කලාවේදීන් ද එක්රැස් වීමට පටන් ගෙන ඇත. ඔහු අසාධ්‍ය තත්ත්වයක ඉන්නා බවට වූ පුවත පළ වී තිබේ. සියල්ල විසින් අපිට උස් හඬින්, පැහැදිලි ව යමක් කියනු ලබන බව ප්‍රතික්ෂේප කළ නොහැකි යඃ මගේ තාත්තාගේ අසනීපයෙන් අඩක් පොදු කටයුත්තක් බවට පත් වේවි. අපිට මුළුමනින් ම දොර වසා දැමිය නොහැකි යි. මන්ද, ඔහු ගැන වන කුතුහලයෙන් බොහෝමයක් එන්නේ කනස්සල්ල, ඇගැයීම සහ සෙනෙහස තුළින් බැවිනි. අපි පැටි වියේ දී, නිවැරදි ව හෝ නැති ව, ලෝකයේ ඉන්නා කීකරු ම දරුවන් අපි ලෙස දෙමාපියන් නිරතුරු අපි හැඳින්වූහ. ඉතින්, බලාපොරොත්තුව ඉටු විය යුතු යි. අපිට ඒ සඳහා ශක්තිය තිබුණා හෝ නැති වුවත්, අපි ආචාරශීලී ව මෙන් ම කෘතවේදී ව ඒ අභියෝගයට ප්‍රතිචාර දැක්විය යුතු යි. පවතින තත්ත්වයන්ට අදාළ ව අපි තීරණය කරන ඕනෑ ම තැනක දී, පොදු සහ පුද්ගලිකත්වය අතර රේඛාව දැඩි ව බල පවත්වන බවට

අම්මා සෑහීමට පත් කරමින් අපි එය කළ යුතු යි. රූපවාහිනියේ පෙන්වන නොහික්මුණු ඕපාදූප එක්කෝ නොතැකීම නිසා හෝ නැතිනම් ඒවාට ඇති ඇබ්බැහිය නිසා, මෙය හැම විට ම ඇයට අතිශයින් වැදගත් විණි. "අපි පොදු මිනිස්සු නෙමෙයි," අපට සිහිපත් කරන්නට ඇය මනාප වූවා ය. ඇට කියවන්නට නොහැකි වන දින තෙක්, මා මෙම මතකාවර්ජනය පළ නොකරන බව මම දනිමි.

මගේ සොයුරා දෙමාසයක් පුරා මගේ පියා දැක නොතිබුණු අතර, තාත්තා සාමාන්‍යයෙන් ඉන්නවාට වඩා අසිහියෙන් ඉන්නා බව ඔහු දකී. තාත්තා ඔහු හඳුනා ගන්නේ නැත. තමා ඉන්නා තැන නොදැන සිටීම ගැන ඔහු නොසන්සුන් ය. මාරුවෙන් මාරුවට ඔහු බලන්නට යන, ඔහුගේ රියැදුරා හෝ ලේකම්වරිය නිසා ඔහු යම් තරමක් සැහැල්ලු වෙයි. එමෙන් ම ඔවුන් දෙදෙනාගෙන් කෙනෙකු හෝ, නැතිනම් කෝකියා හෝ ගෘහ සේවිකාව රෝහලට වී ඔහු සමඟ රැය ගත කරයි. තාත්තා රෑ මැදියමේ අවදි වුවහොත් ඔහු හුරුපුරුදු මුහුණක් දැකිය යුතු නිසා මල්ලි එහි රැඳී සිටීමේ තේරුමක් නැත. ඔහුගේ මානසික තත්වය ඩිමෙන්ෂියාවේ ප්‍රතිඵලයක් ද, නැතිනම් ඔහුගේ වර්තමාන දුර්වලතාවයේ ප්‍රතිඵලයක් ද යන්න වෛද්‍යවරුන්ට කිව නොහැකි නිසා, සති කිහිපයකට පෙර තත්වය සමඟ සංසන්දනය කිරීමේ දී මගේ පියා පෙනෙන්නේ කෙසේ දැ යි වෛද්‍යවරු මල්ලිගෙන් අසයි. ඔහු බොහෝවිට තේරුමක් නැති දේ කියවන අතර සරල ප්‍රශ්නවලට පැහැදිලි පිළිතුරු ලබා දීමට ඔහුට නොහැකි යි. ඔහු යම් තරමකට නරක තත්වයට පත් වී ඇති බව පෙනෙන නමුත් මාස ගණනාවක් තිස්සේ ඔහු සිටියේ මෙවැනි තත්ත්වයක බව මල්ලි සහතික කරයි.

මේ, රටේ ඇති ප්‍රධාන ම ශික්ෂණ රෝහලකි. එනිසා, පළමු වැනි උදෑසන ම පුහුණු වන සිසුන් දහ දොළොසක රංචුවක් රැගෙන වෛද්‍යවරයෙකු පැමිණෙයි. වෛද්‍යවරයා රෝගියාගේ තත්ත්වය සහ ප්‍රතිකාර සමාලෝචනය කරද්දී සිසුන් ඇඳ පාමුල පොදි ගැසී සිටිති. තමා ඇතුළු වී සිටින්නේ කාගේ කාමරයට දැ යි යන්න ගැන තරුණ වෛද්‍යවරුන්ට හාංකවිසියක අදහසක් නොවන බව මල්ලිට පැහැදිලි ය. යාන්තමින් සඟවාගත් කුතුහලයෙන් යුතු ව ඔවුන් ඔහු නිරීක්ෂණය කරද්දී, ටිකින් ටික වැඩි වෙන ඔවුන්ගේ වටහා ගැනීම

මුහුණෙන් මුහුණට දැකගත හැකි වෙයි. ඔවුන්ට ප්‍රශ්න මොනවත් ඇති දැ යි වෛද්‍යවරයා විමසද්දී "නැහැ"යැයි හිස සලන ඔවුහු තාර පැටවුන් මෙන් වෛද්‍යවරයා පසුපස වැටෙති.

මගේ සොයුරා රෝහලෙන් පිට වෙද්දී හෝ රෝහල ඇතුළට එද්දී, අඩුම තරමින් දවසකට දෙවතාවක්වත් පුවත් පත් වර්තාකරුවෝ ඔහුට අඬ ගසති. ඔහු මුල් දහ නව වන සියවසේ මහත්මයකු මෙන් නොවැරදී ම මහත් ආචාරශීලී ය. එබැවින් තමාට සෘජුව අමතන මිනිසෙකු නොසලකා හැරීමට සහජයෙන් ම ඔහුට නොහැකි යි. ඉතින් "ගොන්සාලෝ, අද ඔයාගේ තාත්තට කොහොම ද?" යැයි අසද්දී ඔහුට කණ්ඩායම වෙතට ළං විය යුතු යැයි හැඟෙන අතර එසේ යන ඔහු හිටිවන මාධ්‍ය සාකච්ඡාවක් තුළට කොටු වෙයි. එහි කොටස් මම රූපවාහිනියේ දකිමි. ඔහු හුදු විනයේ ශක්තිය ලබමින් ඉතා දක්ෂ ලෙස, නැතිනම් ආතතියෙන්, ඒ තුළින් සීරුවට රිංගා යයි. මේ පුරුද්ද නතර කරන ලෙස මම ඔහු දිරිමත් කරමි. හිස නමාගෙන, බුම්මාගෙන, තමා වටා ඇති ලෝකය නොතකමින් කෝපි හලකින් එළියට එන සිනමා තාරකාවකගේ ඡායාරූපයක් දකිද්දී ඒ ඇය අශෝභන ලෙස හැසිරෙනවා හෝ උද්ධච්ච නොවන බව මම ඔහුට පැහැදිලි කරමි. ඇය යම් අභිමානයක් ඇති ව හැකි ඉක්මනින් සිය මෝටර් රථයට ළං වෙන්නට උත්සාහ කරනවා පමණ යි. ඔහු මා කියන දෙය අසා ඉන්නේ අපරාධයකට සහභාගී වීමට ඒත්තු ගන්වනු ලබන කෙනකුගේ කම්පනය ඇති ව ය. අවසානයේ දී ඔහු මගේ රෙකමදෝරුව පිළිගන්නා විට, ඒ වරදකාරී හැඟීමක් නැතිව නොවේ. නමුත්, සුළු පුහුණුවකින් පසු, කාලයත් සමඟ, ප්‍රදර්ශන කර්මාන්තයේ මිසදිටු සම්ප්‍රදායන් ගැන තමන්ට මීට වඩා උනන්දු විය හැකි බව ඔහු පිළිගනී.

තාත්තාගේ නිව්මෝනියා තත්ත්වය ප්‍රතිකාරවලට ප්‍රතිචාර දක්වයි. නමුත් ස්කෑන් පරීක්ෂණවලින් ප්ලූරා පෙදෙස තුළ දියර තැන්පත් වීමත්, ඔහුගේ පෙණහලුවල සහ අක්මාවේ සැක සහිත පෙනුමැති ප්‍රදේශත් අනාවරණය කරයි. මේවා හානිදායක ටියුමර තත්ත්වයන්ට පටහැනි දේවල් නොවෙයි. නමුත් පටක විශ්ලේෂණය කිරීමෙන් තොරව ඒ ගැන අනුමාන කරන්නට වෛද්‍යවරු මැලි වෙති. ගැටලුකාරී පෙදෙස්වලට ළං වීම අසීරු බැවින් සාමාන්‍යය නිර්වින්දනය යටතේ පටක ලබා ගත යුතු වෙයි. ඔහුගේ වර්තමාන තත්ත්වය අනුව ඉන්පසු ඔහුට තනි ව ම හුස්ම ගැනීමට නොහැකි